**රබර් නැවත වගා සහනාධාර අරමුදල - 2016**
**-----------------------------------------------------------**

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**------------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
**-------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය

**2. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**2.1 මතය ව්‍යාචනය**
**-------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

ඉකුත් වර්ෂයකදී ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු. 70,659,526 ක් අරමුදලින් අඩුකර දක්වනවා වෙනුවට ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටු දායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විස්තරය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගිණුම් වලින් ඉවත් කළ වත්කම් | 63,438,232 | - වත්කම් පිළප ලේඛන හා වත්කම් බාරගත් බවට ලේඛනය |
| (ආ) ජංගම වත්කම් | | |
| ➢ අත්තිකාරම් ගිණුම් 12 කට අයත් ශේෂ | 15,220,514 | - අත්තිකාරම් ලේඛන<br>- අයවිය යුතු පාර්ශවයන්ගේ නාමලේඛන |
| ➢ මහා භාණ්ඩාගාරයෙන් හා රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂ | 17,353,015 | - තහවුරු කරගැනීමේ ලේඛන |
| ➢ ව්‍යාපෘති අංක 02 ගිණුම | 65,477,579 | |
| ➢ වෙනත් ජංගම වත්කම් ගිණුම් 07 ක එකතුව | 4,101,462 | |
| (ඇ) ජංගම බැරකම් | | |
| ➢ විවිධ තැන්පතු | 9,988,530 | - සනාථ කිරීමේ ලේඛන |
| ➢ ලැබිය යුතු ණය | 473,839 | - ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු |
| ➢ රබර් පාලන අරමුදල | 281,210 | - තහවුරු කරගැනීමේ ලේඛන |
| ➢ පාරිතෝෂික බැදීම් | 90,706 | - ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු |
| ➢ පැල අත්තිකාරම් පොහොර | 119,550 | - තහවුරු කරගැනීමේ ලේඛන |
| ➢ පරිනත වගාවට පොහොර | 4,779,564 | - තහවුරු කරගැනීමේ ලේඛන |
| ➢ අරමුදලට අයත් නොවන ණය | 3,096,701 | - මුදල් ගෙවිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු<br>- බැදීම් ඇතිකර ගැනීමට හේතු |

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

----------------------------------------------------------

2009 ජූලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී අරමුදල ඇවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දින දීය. 2016 මාර්තු 17 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඈවරකරුවකු පත්කර තිබුණද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදකගේ සහය ඇතිව අරමුදලේ කටයුතු ඈවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් 2017 ජූනි 30 වන විටත් පිළියෙළ කර නොතිබුණි.

අරමුදල අවසන් වරට ක්‍රියාකාරි මට්ටමේ පැවති 1997 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ශේෂ පත්‍රයේ සිට සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රය දක්වා ඉදිරියට ගෙනවිත් තිබුණු ඈවර කිරීමට යටත්වන ජංගම වත්කම් හා වගකීම්වලට අයත් ආයතන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බවට හඳුනාගෙන ඇති බැවින් ශේෂ පත්‍රයේ දක්වා ඇති වත්කම් හා වගකීම් සත්‍ය හා සාධාරණ ලෙස නිරූපනය වන ගිණුම් අයිතමයන් නොවන බවට නිරීක්ෂණය කෙරේ.

## 5 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද අරමුදලේ මූල්‍ය ප්‍රකාශන දින 107 ක් ප්‍රමාද වී 2017 ජූනි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.